# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/33 – 2022 නොවැම්බර් මස 16 වැනි බදාදා – 2022.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 168 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2018/H/500.
ප්‍රා. ලේ.ගේ යොමු අංකය: BER/4/5/2/80.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, බේරුවල.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 736, පිණිදියමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වඩුගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක Ka/ BER/2020/697 සහ 2021.06.22 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ඉඩමේ නම සඳහන් නොවේ – ප්‍රමාණය: හෙක්. 0.0012**

උතුරට: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු හිමිකම් කියන පොතුපිටියවත්ත සහ එස්. ඩී. ජයනෙත්ති හිමිකම් කියන පොතුපිටියවත්ත; නැගෙනහිරට: මාර්ගය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි පොතුපිටියවත්ත; දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු හිමිකම් කියන පොතුපිටියවත්ත.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. **කැබලි අක්ෂර 'B' – පොතුපිටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0103**

උතුරට: කැබලි අක්ෂර A සහ මාර්ගය; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි පොතුපිටියවත්ත සහ ඒ. එන්. පෙරේරා සහ තවත් අය හිමිකම් කියන බේරුවලගේවත්ත; දකුණට: ඒ. එන්. පෙරේරා සහ තවත් අය හිමිකම් කියන බේරුවලගේවත්ත; බටහිරට: මීමනගේ කෙනට් කේමසිරි ප්‍රනාන්දු හිමිකම් කියන පොතුපිටියවත්ත සහ කැබලි අක්ෂර A.

EOG 11 - 175